**මධ්‍යම පළාත් සභාව - 2018**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මධ්‍යම පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින නිකුත් කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ජුලි 31 දින නිකුත් කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගනණය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| මුදල් හා බැංකු ශේෂය යටතේ බඩු උකස් ගන්නන්ගෙන් අයකරන ගාස්තු ලෙස රු.18,798,600 ක් දක්වා තිබුණු නමුත් බැංකු සනාථ කිරීම් ලිපිය අනුව එම ශේෂය රු.16,198,600 ක් වීමෙන් රු.2,600,000 ක වෙනසක් විය. | වෙනසට හේතු සොයා බලා නිවැරදි කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |

**1.6.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| (අ) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත ලබා දී තිබුණු අනුමත අත්තිකාරම් සඳහා වූ ණය යටතේ රු. 165,073,802 ක ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි. | අනුමත අත්තිකාරම් හිඟ ණය ශේෂ පියවීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ආ) | ජංගම වගකීම් යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට දක්වා තිබූ රු.8,619,766 ක අන්තර් පළාත් ස්ථානමාරු ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ තුළ රු.1,088,623 ක අන්තර් පළාත් අවිනිශ්චිත ගිණුම ලෙස ශේෂයක් ද දක්වා තිබුණි. | අන්තර් පළාත් ස්ථානමාරු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |

| | | |
|---|---|---|
| (ඇ) විවිධ වගකීම් ගිණුමෙහි වර්ෂ කිහිපයක සිට නොවෙනස්ව ඉදිරියට එන, සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුමේ රු.1,969,736 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් ගිණුම් හිඟ ණය ශේෂ නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 07 ක එකතු වටිනාකම රු.2,671,198 ක් වූ නොපිය වූ අග්‍රිම ශේෂයක් පැවතුණි. | අග්‍රිම ශේෂයන් දෙසැම්බර් 31 දිනට පෙර පියවීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |

**1.6.3 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන**<br>1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත මන්ත්‍රීවරුන්ගේ, සභාපතිවරයාගේ හා විපක්ෂ නායකවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 249 ක් වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා ගෙවිය යුතු එකතුව රු.73,579,724 ක සේව්‍ය සේවක දායක මුදල් යවා නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |

| | | |
|---|---|---|
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 11.2.3 ප්‍රකාරව හැටන් අධ්‍යාපන කලාපයේ පාසැල්වල ගුරුවරුන් 27 දෙනෙකුගේ පරිවාස කාලය සම්පූර්ණවී තිබුණ ද විවිධ හේතූන් මත සේවය ස්ථිර කර නොතිබුණි. | ගුරු භවතුන් දැනුවත් කර පෞද්ගලික ලිපි ගොනුවල අඩුපාඩු සම්පූර්ණ කර සේවය ස්ථිර කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ අඩුපාඩු නිවැරදිකර ගැනීමට කටයුතු කරමි. |
| **(ඇ) මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහය(ප.මූ.රී)** | | |
| (i) ප.මූ.රී.46.1 ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වැය විෂයයන් 18 ක ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.2,111,256 ක බැරකම්වලට බැදීම් ඇතිකර ගෙන තිබුණි. | ප්‍රතිපාදන සීමාව තුළ බැදීම් ඇති කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ ජල විදුලි දුරකථන බිල්පත් සහ ගමන් වියදම් අතිකාල ඉන්ධන බිල්පත් වල වටිනාකම ඇතුළත්ව ඇත. |
| (ii) ප.මූ.රී.378(2) ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙනයනු ලබන ඖෂධ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලට අදාළ රු.13,986,388 ක් වූ සමුච්චිත අතිරික්තය පළාත් සභා ආදායමට බැරකර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව සමුච්චිත අතිරික්තය පළාත් සභා අරමුදලට බැරකළ යුතුය. | පළාත් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට ඉදිරියේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| **(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ආයතන 09 ක පොදු තැන්පත් ගිණුම්වල පැවති තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්මවූ හිමිකම් නොපෑ තැන්පතු රු.14,914,340 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | වර්ෂ 02 ඉක්මවූ හිමිකම් නොපෑ තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වේ. | වසර 2 ඉක්මවූ තැන්පත් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතී. |

**(ඉ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**

-----------------------------------

| | | |
|---|---|---|
| ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/එස්පී/එස්බී/බී/228 දරන 2018 සැප්තැම්බර් 18 දිනැති ලිපිය හා භාණ්ඩාගාර ලේකම්ගේ මු.අ.01/2015(1) දරන චක්‍රලේඛයේ 04(අ) ඡේදය ප්‍රකාරව විදේශ සමුළුවකට සහභාගී වීමට පළාත් සභා අමාත්‍යවරයෙකුට අනුමැතිය ලැබී තිබුණු දින ගණනට වඩා වැඩි දින ගණනක් රැඳීසිටීම වෙනුවෙන් රු.384,913 ක් හා සත්කාරක රාජ්‍ය විසින් ආහාර හා නවාතැන් පහසුකම් සපයා තිබියදී සංයුක්ත දීමනා ලෙස රු.531,537 ක් ගෙවීම නිසා රු.916,450 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගතයුතු වේ. | සත්කාරක රාජ්‍ය විසින් ආහාර සහ නවාතැන් පහසුකම් ලබා දී නැත. |

**(ඊ) වෙනත් චක්‍රලේඛ**

---------------------

| | | | |
|---|---|---|---|
| (i) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය ප්‍රකාරව කොත්මලේ අධ්‍යාපන කලාපයේ පාසැල් 14 ක ගුරුවරුන් 29 දෙනෙකු වසර 10 ට වැඩි කාලයක් ද හැටන් අධ්‍යාපන කලාපයේ පාසැල්වල ගුරුවරුන් 484 දෙනෙකු වසර 08 සිට වසර 32 දක්වා කාලයක් ද එකම පාසැලක සේවය කරමින් තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වඩාත් ඵලදායී ලෙස නියමිත කාලය තුළ ස්ථාන මාරුවීම් ලබා දීම. | අති දුෂ්කර ගණයට අයත් පාසල් වල ගුරුවරුන් ස්ථාන මාරු කිරීමේදී ගැටළු මතුවී ඇත අදාල අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 2018 පෙබරවාරි 15 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 2/2018 හි 2.5 ඡේදය ප්‍රකාරව විනය කටයුතු අවසන් නොමැති ප්‍රධාන ලේකම් කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරුවරියකට, මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම. | අදාළ ආයතන වලින් පිළිතුරු ලද විගස ඉදිරිපත් කරමි. |

අධ්‍යක්ෂට හා විල්ගමුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට 2018 වර්ෂයේ දී සහනදායී පදනම මත මෝටරථ ආනයන බලපත්‍ර නිකුත්කර තිබුණි.

## 2. ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 09 ක ශුද්ධ ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර විචලනය රු.498,820 සිට රු.190,477,192 ක් දක්වා එනම් සියයට 11 සිට සියයට 128 ක් දක්වා වූ පරාසයකින් වැඩිවී තිබුණු අතර ආදායම් සංකේත 10 ක ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම අතර විචලනය රු.1,662,197 සිට රු.508,588,856 ක් දක්වා එනම් සියයට 10 සිට සියයට 93 ක් දක්වාවූ පරාසයක අඩුවීමක් පැවතුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අඩුපාඩු පිළිගනිමි. |
| (ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම් විෂයන් 05 ක ආදායම සියයට 11 සිට සියයට 68 දක්වා අඩුවී තිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී හැකිතාක් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අඩුපාඩු පිළිගනිමි. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පාළාත් පාලන ආයතනවලට අදාළව ප්‍රධාන ලේකම් විසින් රැස් කරන ලද මුද්දර ගාස්තු රු.712,734,330 ක් හා උසාවි දඩ රු.287,631,648 ක් එම ආයතනවලට ලබා දීමට කටයුතු කර නොතිබුණු අතර එම ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රධාන ලේකම්ගේ ගිණුමට රැස්වන උසාවි දඩ හා මුද්දර ගාස්තු අදාළ ආයතනවලට ලබාදීම හා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලැබී නැත. |

| | | |
|---|---|---|
| (ඇ) ආදායම් සංකේත අංක 10-02-07-01 දේපළ පැවරුම් මත මුද්දර ගාස්තු යටතේ හිඟ ආදායම 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ රු. 7,305,912 කින් වැඩි වී තිබුණු අතර එය සියයට 18 ක වැඩිවීමකි. | වැඩිවන හිඟ ආදායමට සාපේක්ෂව ඇස්තමේන්තු පිළියෙල කිරීම. පිළියෙල කරමි. | පිළිගනිමි. |
| (ඉ) කෘෂිකාර්මික හා වෙනත් කටයුතු සඳහා වාර්ෂික බදු කොන්දේසි යටතේ ලබා දී තිබූ රජයේ ඉඩම් වලින් 2006 වර්ෂයේ සිට 2018 වර්ෂ සඳහා රු.209,178 ක හිඟ බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කිරීම. | පිළිගනිමි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 28,974,672,234 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 28,112,420,432 ක් විය.

## 4. ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

### 4.1 ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම

#### 4.1.1 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) රාගල බස් නැවතුම්පල පවත්වාගෙන යනු ලබන ඉඩම මිලදී ගැනීම සඳහා රු.6,668,311 ක මුදලක් 2018 ජනවාරි 09 දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා තිබුණද ඉඩමේ ඔප්පුව මේ වන තෙක් ලැබී නොතිබුණි. | හිමිකාරිත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩමේ නීත්‍යානුකූල හිමිකාරිත්වය ලබා ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත මෙම මුදල් ගෙවා ඇති නමුත් ඔප්පුව ලබා ගැනීම සඳහා අදාළ ආයතන දැනුවත් කර ඇති බව සඳහන් කරමි. |

#### 4.1.2 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

| | | |
|---|---|---|
| (අ) මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාල තුනකට අදාළව ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී අවශ්‍යතාවයකින් තොරව මිලදීගත් රු.4,045,363 ක් වටිනා ද්‍රව්‍ය වර්ෂයකට වැඩි කාලයක් භාවිතයට නොගෙන පැවතුනි. | අවශ්‍යතා පුරෝකථනය කර මිලදී ගැනීම් කළ යුතු වේ. | හදිසි ආපදා තත්වයන්ට මුහුණ දීම සඳහා තොග තබාගෙන ඇත. |

| | | |
|---|---|---|
| (ආ) මාර්ග සංවර්ධන අධිකාරිය සතු දිඹුලපතන පිහිටි වර්ග අඩි 4261 ක් වූ ඉංජිනේරු නිල නිවාසය (PJ ගොඩනැගිල්ල) වසර 03 කට බදු දීමේ දී රු.14,790,000 ක පාඩුවක් සිදුවී තිබුණු අතර බදු ගිවිසුමෙන් අනතුරුව ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා අධිකාරිය විසින් රු.1,444,038 ක් වැය කර තිබුණි. | තක්සේරු වටිනාකම අනුව ඉඩම හා ගොඩනැගිල්ල බදු දීමට කටයුතු කළ යුතු වේ. | බදු ගිවිසුම සංශෝධනය කරන බව හා ලංසුව පිරිනමා තිබියදී බදුදුන් ගොඩනැගිල්ල අලුත් වැඩියා කළ අතර උපාංග 2019 මැයි 30 දිඹුල විධායක ඉංජිනේරු කාර්යාලයට භාර දී ඇත. |
| (ඇ) 2018 අගෝස්තු 25 දිනැති අංක 1077 දරන වටිනාකම රු.10,440,000 ක් වූ බදු ගිවිසුම අනුව, වසර 03 ක කාලයක් සඳහා රජයේ තක්සේරු මුදල සැලකිල්ලට ගෙන වසර 29 ක් සඳහා බදු දීමෙන් අධිකාරියට වන පාඩුව රු.14,790,000 ක් වීම. | වගකිව යුතු අය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | එවකට සිටි සභාපතිවරයාට අතපසුවීමක් සිදු වී ඇති බැවින් බදු ගිවිසුම සංශෝධනය කරමි. |

**4.1.3 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය (රේඩා)**

| විගණන නිරීක්ෂණය | නිර්දශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයේ ප්‍රඥප්තියේ 05 ඡේදය පරිදි විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල නොකර බඳවා ගැනීම් සිදුකර තිබුණු අතර ප්‍රඥප්තියේ 05 ඡේදයට අනුව ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා දීප ව්‍යාප්ත සේවාවකට අයත් ජ්‍යෝෂ්ඨ නිලධාරියකු පත්කළ යුතු වුවත් ආයතනය ආරම්භයේ සිටම වැඩ බලන අධ්‍යක්ෂවරුන් පත්කර තිබුණි. | විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඒ අනුව කටයුතු කිරීම. | ප්‍රඥප්තියේ 5 වගන්තියට අනුව 44 වන කළමණාකරන මණ්ඩල රැස්වීමේ දී ප්‍රතිපත්තිමය එකඟවීම මත මෙම බඳවා ගැනීම් පරිපාටිය සකස්කර ඇත. අධ්‍යක්ෂ පත් කිරීම සම්බන්ධව පිළිතුරු සපයා නොමැත. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයේ අවසන් කිරීමට නොහැකිව තිබූ කෘෂිකාර්මික ව්‍යාපෘතිවලින් රු.5,082,015 ක් ඉතිරිව තිබුණු අතර 2018 වර්ෂයේ දී ද එම ව්‍යාපෘති නිමකර ගැනීමට නොහැකි වීම නිසා වැයකර තිබුණේ රු.1,313,285 ක් පමණි. ඒ අනුව ඉදිරි වර්ෂය සඳහා ද රු.3,769,730 ක ව්‍යාපෘති ඉටු කළ යුතුව පැවතුණි. | ප්‍රමාදවීමට හේතු සොයා බලා ඉටු කිරීම් කඩිනම් කිරීම. | පිළිතුරු ලැබී නොමැත. |
| (ඇ) කටුකිතුල මගී ගිමන් හලේ අතුරු බදු ගිවිසුම් කාලය 2018 සැප්තැම්බර් 30 දින අවසන්ව ඇතත් 2019 මැයි වන විටද ගිමන්හල ආපසු ලබාගැනීමට හා රු.1,556,990 ක හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකිරීමට කටයුතු කිරීම හා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |

**4.1.4 සමුපකාර සේවක විශ්‍රාම වැටුප් පාලක අරමුදල**

| | | |
|---|---|---|
| අදාළ ප්‍රඥප්තියේ 8.42.1 වගන්තිය ප්‍රකාරව 2008 සිට 2018 දක්වා කාලයට අදාළ වාර්ෂික ගිණුම් හෝ පාලන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රඥප්තියට අනුව කටයුතු කළ යුතු වේ. | 2007 – 2015 දක්වා වර්ෂවල ගිණුම් වාර්තා පළාත් විගණන අධ්‍යක්ෂ වෙත යවා ඇත. |

**4.1.5 මුල් ළමා විය සංවර්ධන ඒකකය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) 2015 අංක 03 දරන ප්‍රඥප්තිය ප්‍රකාරව පිහිටුවා ඇති මුල් ළමාවිය සංවර්ධන ඒකකයේ වාර්ෂික ගිණුම් 2016 වර්ෂයේ සිට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රඥප්තිය අනුව ගිණුම් ඉදිරිපත් කළ යුතු වේ. | මෙහි සියළු වියදම් පළාත් සභා වැය ශීර්ෂයන් යටතේ ප්‍රධාන අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන අතර සියළු වියදම් විසර්ජන ගිණුම මඟින් ඉදිරිපත් කරයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මධ්‍යම පළාත තුළ පිහිටි සියලුම පෙර පාසල් ලියාපදිංචි කළ යුතු වුවත් 3,380 ක් වූ මුළු පෙර පාසල් සංඛ්‍යාවෙන් 2,378 ක් පමණක් ලියාපදිංචි කර තාවකාලික සහතික ලබාදී තිබුණි. | මධ්‍යම පළාත තුළ සියලුම පෙර පාසල් ලියාපදිංචි කළ යුතු වේ. | පුවත්පත් දැන්වීම් මඟින් හා ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් දැණුවත් කර ඇත. වතු ආශ්‍රිතව ලියාපදිංචියේ පසුබෑමක් ඇත. |

**4.2 වාණිජ අත්තිකාරම් ගිණුම්**

**4.2.1 අංක 552202 දරන ගුරුදෙණිය අධ්‍යාපන සංවර්ධන කේන්ද්‍රයේ වාණිජ අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 2017 හා 2018 වර්ෂවලට අදාළ රු.736,450 ක ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ආදායම් කිහිපයක් සඳහා රිසිට්පත් නිකුත් කර ගිණුම්ගත කර ඇත. අනෙක් ඒවාට P.I.V. නිකුත්කර ගිණුම්ගත කරන බව. |
| (ආ) | වටිනාකම රු.341,000 ක් වූ ආකාශ වස්තු උපකරණ 10 ක් හා රු.1,299,300 ක වටිනාකමින් ඉදිකිරීම් කළ ආකාශ වස්තු නැරඹුම් මධ්‍යස්ථානය ස්ථාවර වත්කම් උපලේඛනයේ දක්වා නොතිබුණි. | ජංගම නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ දී තොග පොත්වලට ඇතුළත් කල ද ගිණුමට ගැනීමට අතපසුවිය. |
| (ඇ) | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අත්තිකාරම් ගිණුම්වල හර හා බැර මාසික ගිණුම් සාරාංශ මඟින් පළාත් භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණු අතර ප්‍රාග්ධන වත්කම්වල ක්ෂය වටිනාකම, ක්ෂය සංචිත අරමුදලට බැර කිරීම පිණිස පළාත් භාණ්ඩාගාරයට මුදලින් යවා නොතිබුණි. | පළාත් මුල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2016 සිට භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි සංචිතයට බැර කිරීම සඳහා කටයුතු කරමි. |

**4.2.2 අංක 550202 දරන මාපනාවතුර සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබන මේස පුටු අලුත්වැඩියා කිරීමට අදාළව 2018 වර්ෂයේ දී නිෂ්පාදන ගිණුමක් පිළියෙල කර නොතිබුණු අතර රු.2,497,888 ක් වූ අවසන් අමුද්‍රව්‍ය තොග ගිණුමේ දක්වා නොතිබුණි. ඒ තුළ පැවති රු.1,234,766 ක් වටිනා ලී බඩු වේයන්ගේ ග්‍රහනයට ලක්ව තිබුණි. | අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම් කළ යුතු අතර අතිරික්ත අමුද්‍රව්‍ය තොග උපයෝජනය සඳහා නොපමාව නිෂ්පාදන කටයුතු ආරම්භ කළ යුතු වේ. | ඩෙස් පුටු අළුත්වැඩියා කිරීම කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම ආරම්භයේ සිට 2017 වර්ෂය දක්වා ඌනතාවයක් පැවතීම හේතුවෙන් ගිණුම් පියවා වසා දැමීමට 2018 වර්ෂයේ අනුමැතිය ඉල්ලා තිබුණද ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | දිගින් දිගටම ඌනතාවයක් පවතින්නේ නම් ප්‍රතිසංවිධානය කිරීමට හෝ ගිණුම් පියවා වසා දැමීමට කටයුතු කළ යුතු වේ. | විගණනයේ නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී. |

**4.2.3 අංක 550203 දරන හැටන් සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) ආයතනයේ දැක්ම හා පරමාර්ථයන් ඉටුකෙරෙන ආකාරයට සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | එකඟ වෙමි. ඉදිරි වර්ෂයේදී පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ආ) ආයතනයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රඥප්තියේ කෙටුම්පත 2015 සැප්තැම්බර් 30 දිනට පෙර සකස් කිරීමට 2015 ජූලි 16 දින රැස් වූ කළමනාකරණ කමිටුව තීරණය කර තිබුණද 2019 අප්‍රේල් 10 දින වනවිටද අදාළ ප්‍රඥප්තිය සකස් කර නොතිබුණි. | ප්‍රඥප්තිය සකස් කිරීම කඩිනම් කළ යුතු වේ. | එකඟ වෙමි. මීලඟ පාලක මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කිරීමට ඇතුළත් කරගන්නා ලදි. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට වාණිජ අත්තිකාරම් ගිණුමේ ආදායම්, වියදම්, වත්කම්, වගකීම් හා හිමිකම් ගිණුම් 39 කට අදාලව ලෙජර් ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලෙජර ගිණුම පවත්වාගෙන යා යුතු වේ. | මෙම ආයතනයේ ඉතා සුළු ගණුදෙනු ප්‍රමාණයක් පමණක් සිදුවන බැවින් වෙනම ලෙජරයක් නඩත්තු කර නොමැත. |
| (ඈ) ප්‍රාග්ධන වත්කම්වල ක්ෂය වටිනාකම, ක්ෂය සංචිත අරමුදලට බැර කිරීම පිණිස පළාත් භාණ්ඩාගාරය වෙත මුදලින් යවා නොතිබුණි. | පළාත් මූල්‍ය රීති ප්‍රකාර ගිණුම් කටයුතු සිදු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරගැනීමට කටයුතු කරමි. |

### 4.3 අනෙකුත් අත්තිකාරම් ගිණුම්

#### 4.3.1 පළාත් රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 3033 ක ගෙන් ලැබිය යුතු රු.78.415,012 ක ණය ශේෂය තුළ වසර 1 සිට 22 දක්වා කාලයකට අදාළව ලැබිය යුතු රු.72,210,770 ක් පැවති අතර නිලධාරීන් 1126 දෙනෙකු වෙනුවෙන් පියවිය යුතු රු.33,805,835 ක ණය ශේෂය තුළ වසර 1 සිට 22 දක්වා කාලයට අදාළව පියවිය | අයවිය යුතු හා පියවිය යුතු ණය ශේෂ වක්‍රලේඛය ප්‍රකාර නියමිත කාලය තුළ නිරවුල් කළ යුතු වේ. | 2019 මැයි 31 දින වන විට ණය ගැති ශේෂ 55 ක් සඳහා රු.2,715,061 ක් ද ණය හිමි ශේෂ 55 ක් සඳහා රු.2,647,600 ක් ද නිරවුල් කර ඇති අතර මු.රෙ. 104(4) පරීක්ෂණ මණ්ඩලයක් මඟින් හඳුනාගත් රු.9,136,723 ක ණය ගැති ශේෂය කපා හැරීමට අනුමැතිය සඳහා පළාත් භාණ්ඩාගාරය වෙත |

| | | | |
|---|---|---|---|
| | යුතු රු.28,465,005 ක් ඇතුළත්ව තිබුණි. | | යවා ඇත. |
| (ආ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විශ්‍රාම/මිය ගිය නිලධාරීන් 265 දෙනෙකුගෙන් අයවිය යුතු රු.12,871,790 ක ණය ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි රු.823,902 ක් හා වැඩ තහනම් කළ/ සේවය අතහැර ගිය නිලධාරීන් 121 දෙනෙකුගෙන් අයවිය යුතු රු.4,149,068 ක ණය ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි රු.2,750,140 ක ශේෂයක් ඇතුළත්ව තිබුණි. | විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය නොවීමට හේතු සොයා බලා අයකිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 මැයි 31 දින වන විට රු.5,056,842 ක් ලැබී ඇත. අනෙකුත් ණය ශේෂ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අතර රු.7,668,880 ක වෙනසක් පැවතුණි. | පවතින ශේෂයන්ගේ වෙනස්කම් හැකි ඉක්මනින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | වැඩිපුර අයවීම් අදාළ නිලධාරීන්ට ගෙවා ඇති අතර රු.5,815,894 ක සාවද්‍ය බැර වටිනාකම ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**4.3.2 පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා අත්තිකාරම් ගිණුම**
**--------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2001 මාර්තු 28 දිනැති අංක මුදල් 01/2001 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මියගිය මන්ත්‍රීවරයෙකුගෙන් අයවිය යුතු රු. 92,176 ක ණය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඇපකරුවන්ගේ අය කර ගැනීමට දන්වා යවා ඇත. |

| | | |
|---|---|---|
| (ආ) ධූරය අත්හැර ගොස් ඇති මන්ත්‍රීවරයෙකුගෙන් අයවිය යුතු රු. 157,114 ක් 2006 සැප්තැම්බර් 04 දින සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති අංශය හරහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්ය සාධනය

#### 5.1.1 රජයේ ප්‍රදාන

පළාත් සංවර්ධන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයට ලැබී තිබූ ප්‍රතිපාදන සහ උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 2,039.31 | 1,566.84 | 472.47 |
| (ආ) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 481.86 | 355.34 | 126.53 |
| (ඇ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (අධ්‍යාපන) | 286.92 | 279.42 | 7.50 |
| (ඈ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 592.89 | 396.96 | 195.93 |
| | එකතුව | 3,400.98 | 2,598.56 | 802.43 |

## 5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක බීඩී/ජීපීඑස්/130/9/14/එම්සී දරන 2016 ජනවාරි 06 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව යතුරුපැදි ලබාගෙන වෙනත් තනතුරුවලට ගිය ක්ෂේත්‍ර නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,617,180 ක් අයකර ගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. | දැනුම් දී තිබෙන නමුත් අදාළ නිලධාරීන් විසින් මුදල් ගෙවීමට ඉදිරිපත් වී නොමැත. |
| (ආ) දීර්ඝ කාලීන බදු ලේඛනය අනුව 2016 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ බදු දීමට මැනුම් කටයුතු නොකළ ඉඩම් කට්ටි 17 ක් පැවැති අතර, 2019 පෙබරවාරි 28 වන විටත්, එම ඉඩම් බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මැනීම් කටයුතු නිම කර බදු දීමට නියමිත පාර්ශවයන්ට කඩිනමින් බදු දීමට කටයුතු කර ආදායම් උපයා ගැනීම. | පිළිතුරු සපයා නැත. |
| (ඇ) කොත්මලේ අධ්‍යාපන කලාපයේ පිහිටි පාසැල් 85 න් පාසැල් 78 ක් විසින් පරිහරණය කරන ඉඩම්ද නුවරඑළිය අධ්‍යාපන කලාපය තුළ පිහිටි පාසැල් 156 කින් පාසැල් 153 ක් විසින් පරිහරණය කරන ඉඩම් ද අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | පාසැල් විසින් පරිහරණය කරන ඉඩම් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කිරීම. | අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | මහනුවර සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ නිලධාරියකුගේ විනය විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් මූලික විමර්ශනය පවත්වා චෝදනා පත්‍රය නිකුත් කිරීමට වසර 10 ක් ගතවී තිබුණු අතර විනය නියෝග ක්‍රියාත්මක කිරීමට වසර 03 ක් ගතවී තිබුණි. එම කාලය තුළ ඔහුට වැටුප් වර්ධක සහ වැටුප් ණයද ලබා දී තිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කිරීම. | පිළිතුරු සපයා නැත. |
| (ආ) | හැටන් අධ්‍යාපන කලාපයට අයත් පාසැල් 51කට අදාළව 2017 හා 2018 වර්ෂවල ලැබී තිබුණු පැමිණිලි 91 ක් සම්බන්ධයෙන් මූලික විමර්ශන සිදුකිරීම සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කර තිබුණ ද පැමිණිලි 42 ක් සම්බන්ධයෙන් පමණක් වාර්තා ඉදිරිපත්කර තිබුණි. | අප්‍රමාදව විමර්ශන කටයුතු සිදුකර ඒ අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. | අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | කොත්මලේ අධ්‍යාපන කලාපයේ පිහිටි පාසැල් 17 ක අළුත්වැඩියාවන් සඳහා රු.19,540,000 ක ඇස්තමේන්තුවක් සකසා තිබූ නමුත් 2018 වර්ෂය තුළ රු.3,521,585 ක් වැයකර පාසැල් 04 ක අළුත්වැඩියා කටයුතු පමණක් සිදුකර තිබුණි. | ප්‍රමුඛතාවයන් තීරණය කර අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම. | අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) රිකිල්ලගස්කඩ පශු වෛද්‍ය කර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී සිදුකර තිබූ කෘතිම සිංචන 3163 න් 2481 ක් පෞද්ගලික කෘතිම සිංචන ශිල්පීන් විසින් සිදුකර තිබුණු අතර ඒ අනුව ආයතනය මගින් සිදුකර ඇති කෘතිම සිංචන ප්‍රමාණය සියයට 28 කි. | කෘතිම සිංචන කටයුතු පෞද්ගලික අංශය මගින් සිදුකළ ද දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්යසාධනය වර්ධනය විය යුතු වේ. | රිකිල්ලගස්කඩ පශු වෛද්‍ය බල ප්‍රදේශයට ග්‍රාම නිලධාරී වසම් 131 ක් අයත්වන අතර පවතින නිලධාරී හිඟය නිසා පුද්ගලික කෘතිම සිංචන නිලධාරින් සේවයේ යෙදවීමට සිදුවී ඇත. |
| (ඉ) මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් 1996 - 2016 දක්වා වර්ෂවල සිට සිදු කෙරෙමින් පවතින රාජ්‍ය ආයතන වෙනුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු 19 ක විශාල ප්‍රමාදයන් පැවතුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම. | පිළිතුරු ලැබී නැත. |

## 5.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පැවති ජලභීතිකා මර්ධන කටයුතු 2018 අප්‍රේල් 01 දින සිට පළාත් සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පවරා තිබුණු නමුත් සේවකයින් පවරාගෙන නොතිබුණි. ඒ අනුව මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්තව සිටි පශු එන්නත් ක්ෂේත්‍ර සහකාරවරු 15 දෙනෙකුට එදින සිට රාජකාරි පැවරීමෙන් තොරව මාස 06 ක කාලයක් සඳහා රු.3,813,738 ක වැටුප් ගෙවා තිබුණි. | මෙම නිලධාරීන්ට මාස 06 ක කාලයක් සඳහා රාජකාරී පැවරීමෙන් තොරව වැටුප් ගෙවීමට වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් කටයුතු කිරීම. | ඡේදය පිළිගනිමි. |

## 5.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| පළාත් සභා සංකීර්ණයේ කිලෝවොට් 45 ධාරිතාවයකින් යුත් ජාල ගත සූර්ය විදුලි බල ජනන පද්ධතියක් රු.10,104,920 ක වියදමින් 2014 වර්ෂයේ සවිකර තිබුණු අතර මුල් වසර 05 තුළ වැය වන මුදල ආවරණය වන බව ව්‍යාපෘති වාර්තාවේ දක්වා තිබුණි. එහෙත් වසර 3 ½ ක් ගතවීමේ දී සියයට 70 ක් ආවරණය විය යුතු වුවත් ආවරණය වී තිබුණේ සියයට 2.5 ක් තරම් අඩු ප්‍රමාණයකි. | ශක්‍යතා අධ්‍යයන වාර්තාවෙන් පෙන්වා දී ඇති අපේක්ෂිත විදුලි නිෂ්පාදිතය හා තත්‍ය විදුලි නිෂ්පාදිතය අතර විශාල විචලනයක් පවතින බැවින් ඒ සඳහා හේතු සොයාබලා පිළියම් යෙදීම. | කාලගුණ වෙනස්වීම් හේතුවෙන් සෑම වර්ෂයකම සමාන විදුලි ඒකක ප්‍රමාණයක් ජනනය කළ හැකි බවට අපේක්ෂිත කල නොහැකිය. එබැවින් එක් වර්ෂයකට සාපේක්ෂව අනෙක් වර්ෂයේ ජනනය කරන විදුලි ඒකක ගණන අඩු හෝ වැඩි විය හැකිය. මෙය නියමු ව්‍යාපෘතියක් වන බැවින් සම්පූර්ණ ලාභ අපේක්ෂාවක් කළ නොහැකිය. |

## 5.6 හඳුනා ගන්නා ලද පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනතුරට පත්වූ වාහන 124 ක පාඩුව වූ රු.17,236,527 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කරගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණු අතර එයින් රු.8,416,036 ක් වූ පාඩුවලට අදාළ වාහන 51 ක් අනතුරට පත්වී වසර 05 කට වැඩිකාලයක් ගතවී තිබුණි. | පාඩු හා හානි අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කිරීම. | 2018 මූල්‍ය ප්‍රකාශ වල අනාවරණය කර ඇත. |
| (ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත වාර්තා වූ එකතුව රු.811,224 ක් වූ හානි පාඩු | රජයට සිදුවූ හානි පාඩු සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. | සිද්ධිවල බරපතල කම හා කඩිනම් කිරීමේ අවශ්‍යතාවය සලකා ප්‍රමුඛතාවය මත |

| | | |
|---|---|---|
| සිද්ධීන් 05 ක් හා වටිනාකම හඳුනානොගත් සිද්ධීන් 14 ක් ලෙස මුළු හානි පාඩු 19 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු පුද්ගලයන් නිශ්චය කිරීමට කටයුතු කර නොතිබුණි. | | පරීක්ෂණ සිදු කරමින් පවතී. |
| (ඇ) සභා ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ පළාත් සභා මැති ඇමතිවරුන් සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීමේ වැඩසටහන යටතේ ධූරධාරීන් 26 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු. 2,789,100 වටිනා පරිගණක යන්ත්‍ර 26 ක් ගිවිසුම් ප්‍රකාරව ආපසු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත |
| **5.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු** | | |
| තෙල්දෙණිය කලාපයේ ප්‍රාථමික විද්‍යාලයක පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,149,083 ක් වැයකර ඉදිකර තිබූ පැතිබැම්ම සෝදායාම හා ඒ හේතුවෙන් ගොඩනැගිල්ල පිටුපස කොන්ක්‍රීට් කානුව හා කොන්ක්‍රීට් පැතිබැම්ම පුපුරා ගිලාබැසීමට ලක්වීම හේතුවෙන් ගොඩනැගිල්ල අවදානම් තත්වයේ පවතින බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | ව්‍යාපෘති සඳහා යෙදවූ මුදල් නිශ්කාර්ය වීම වැළැක්වීමට වගබලා ගත යුතු වේ. | විධිමත් පරිදි වැසි ජලය බැහැරවන කානු පද්ධතියක් ඉදිකළ යුතු වුවද ප්‍රතිපාදන වෙන්වී නැත. පස් පුරවා සම්පූර්ණ කර ඇත. |

## 5.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධනය පදනම ලෙස පාසැල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියට (TSEP) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලැබී වියදම් නොකර ඉතිරිව තිබූ රු.240,059,311 කින් රු.48,559,308 ක මුදලක් අනුමැතියෙන් තොරව හා මුදල් යොදවන ආකාරය නිශ්චිතව හඳුනානොගෙන පාසල් අතර බෙදාදී තිබුණු අතර TSEP ව්‍යාපෘතිය මගින් ඉදිකිරීමට යෝජිතව පැවති ව්‍යාපෘති අතුරින් රු.4,449,000 කට ඇස්තමේන්තුගත ව්‍යාපෘති 10 ක් සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි. | ව්‍යාපෘති තෝරා ගැනීමේ අදියරේ දී අවශ්‍ය ව්‍යාපෘති නිවැරදිව තෝරා ගතයුතු වේ. | විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් පාසැල් සංවර්ධන සමිති හරහා ඉදිකිරීමට අනුමැතිය නොදුන් බැවින්ද ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින්ද ඉටුකර ගැනීමට නොහැකි වූ බැවින් ද එම ව්‍යාපෘති අත් හැරීමට සිදුවිය. ව්‍යාපෘති 07 ක් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ඉදිකිරීමට සිදුව ඇත. |

### 5.8.1 ප්‍රමාද වූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පාසල් ගොඩනැගිලි 07 ක් ඉදිකිරීම වෙනුවෙන් 2016,2017 හා 2018 වර්ෂවල සිට වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිවෙලින් රු.45,584,076 ක්, රු.31,110,028 ක් හා රු.37,713,835 ක් අවිච්ඡේද වී තිබුණි. ව්‍යාපෘති ආරම්භ කර අතරමග නතරවීම තුළ එම ප්‍රතිපාදන ඒ ඒ වර්ෂයන්වලදී වෙනත් කාර්යයක් සඳහා යෙදවීමටද නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම මනා සැලැස්මකින් හා නිවැරදි ශක්‍යතා අධ්‍යයනයකින් පසුව අපේක්ෂිත කාලය තුළ කළ හැකි ව්‍යාපෘති වෙනුවෙන් පමණක් ප්‍රතිපාදන යෙදෙවිය යුතු වීම හා එම වර්ෂයට වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයට ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | විගණනයේ නිර්දේශ ක්‍රියාත්මක කරන බව සඳහන් කරමි. |

| | | |
|---|---|---|
| **5.8.2 අත්හැර දැමූ ව්‍යාපෘති**<br>---------------------<br><br>පාසැල් 05 ක රු.31,253,881 ක් වූ ඉදිකිරීම් කර්මාන්ත 2016 සිට 2018 දක්වා කාලය තුළ අතරමග නවතා තිබුණු අතර ඒවායේ භෞතික ප්‍රගතිය සියයට 30 සිට සියයට 75 අතරද මූල්‍ය ප්‍රගතිය සියයට 17 සිට සියයට 43 අතරද පැවතුණි. මෙම කර්මාන්ත අතුරින් එක් කර්මාන්තයක කාර්ය සාධන ඇපකරය ව්‍යාජ එකක් වූ අතර අතරමග නතර කර තිබූ කර්මාන්ත 02 කට අදාළ කාර්ය සාධන ඇපකර මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති ඇරඹීමට ප්‍රථම මනා සැලැස්මකින් හා ශක්‍යතා අධ්‍යනයකින් පසුව අපේක්ෂිත කාලය තුළ කළ හැකි ව්‍යාපෘති වෙනුවෙන් පමණක් ප්‍රතිපාදන යෙදවිය යුතු වීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කලයුතු වීම. | • ව්‍යාපෘති 02 ක කොන්ත්‍රාත්කරු ව්‍යාපෘති පැහැර හැර ඇති බැවින් නැවත ප්‍රසම්පාදනය කල යුතුය. එක් ව්‍යාපෘතියක ඇපකරය ව්‍යාජ එකකි.<br>• ව්‍යාපෘති දෙකක කර්මාන්තය ඉටු නොවීම මත ප්‍රමාද ගාස්තු අයකර ඇත.<br>• එක් ව්‍යාපෘතියක් අවසන් නොකිරීම නිසා කාර්ය සාධන ඇපකරය බිල්පතින් රඳවා ගෙන ඇත. |
| **5.8.3 අරමුණෙන් බැහැර ක්‍රියාකාරකම්**<br>-------------------<br><br>පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාම සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය විසින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන යටතේ සංවර්ධන කටයුතු සඳහා ලද රු.1,101,221 ක මුදලක් වැයකර ලිපිද්‍රව්‍ය හා ස්ථාවර වත්කම් මිලදීගෙන තිබුණි. | ප්‍රතිපාදන අදාළ සංවර්ධන අරමුණට යොදා ගැනීම. | පිළිතුරු ලබා දී නැත |

**5.9 වත්කම් කළමනාකරණය**

**5.9.1 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) නාරම්පනාව, උඩුවෙල හා දෙල්තොට ඇතුළු ප්‍රාදේශීය රෝහල් 11 කට 2015 වර්ෂයේදී ලබාදී තිබූ රු.16,498,000 ක් වටිනා Defidrillator යන්ත්‍ර 11 ක් වසර 03 කට අධික කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | භාවිතයට ගත හැකි රෝහල් වෙත නිකුත් කිරීම. | පිළිතුරු සපයා නැත |
| (ආ) හගුරන්කෙත ප්‍රදේශයේ අංග සම්පූර්ණ වාට්ටු සහිත ආයුර්වේද රෝහලක් පිහිටුවීම සඳහා 2002 වසරේ සැලසුම්කර තිබූ තෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහල පමණක් ඉදිකර 2006 නොවැම්බර් මස 22 දින මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණ ද අදාළ ගොඩනැගිල්ල මේ දක්වා ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | භාවිතයට ගැනීමට කටයුතු කිරීම | පිළිගනිමි. |
| (ඇ) පරණගම මධ්‍ය මහා විද්‍යාලයේ පැරණි පරිගණක කාමරය පහසුකම් සහිත පන්ති කාමර (Smart class room) සඳහා යොදාගත් පසු එහි පැවති වායුසමීකරණ 03 ක් හා මහින්දෝදය විද්‍යාගාරය සඳහා ලබාදී තිබුණු උපකරණ 33 කට අදාළ අයිතම ඒකක 53 ක් නිෂ්කාර්යව පැවතුණි. | රජයේ වත්කම් නිශ්කාර්ය නොවීමට වගබලා ගත යුතුවේ. | • Smart class room සඳහා වායු සමීකරණ අවශ්‍ය නොවන බවත් ඒ සඳහා වැය වන වියදම් සංවර්ධන සමිතියට දැරීමට අපහසු බැවින් මෙම වායු සමීකරණ වෙනත් පාසැලකට ලබා දීමට කැමති බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) ගලේවෙල ප්‍රාථමික විද්‍යාලයේ පරිගණක මධ්‍යස්ථානයේ පරිගණක 12 ක් වසරක පමණ කාලයක සිට අක්‍රීයව පැවති අතර පුස්තකාලය වසරක පමණ කාලයක සිට වසා දමා තිබුණි. මප/ග/බෙලිගමුව කණිෂ්ඨ විද්‍යාලය සතුව පරිගණක 10 ක් පැවතියත් පරිගණක ගුරුභවතෙකු නොමැතිවීම ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි. | ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම හා පරිගණක ඒකකය ඵලදායීව භාවිතයට ගත යුතු වේ. | ගුරු භවතුන් ලබා දීමට ප්‍රමුඛතාවය දී කටයුතු කරමි. |
| (ඉ) ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් රු. 18,318,444 ක වියදමින් ඉදිකළ මහල් 03 කින් සමන්විත ගොඩනැගිල්ල 2012 දෙසැම්බර් මාසයේ සභා ලේකම් වෙත පැවරීමෙන් අනතුරුව ඒ සඳහා රු.2,640,165 ක ගෘහ භාණ්ඩ මිලදී ගෙන මන්ත්‍රීවරුන් සඳහා සංචාරක නිවාසයක් බවට පත්කර තිබුණි. මෙම ගෘහ ඒකකයේ මහල් 02 ක් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාලය තුළ දින 121 ක් පමණක් භාවිතා කර තිබුණු අතර ඉන් 2018 වර්ෂය තුළ දී දින 06 ක් පමණක් භාවිතා කර තිබුණි. | ඌන උපයෝජිතව පවතින උපකරණ හා ගොඩනැගිල්ල ඵලදායී කාර්යයක යෙදවීමට කටයුතු කිරීම. | දැනට සභාව විසුරුවා ඇති බැවින් නිල නිවාස වසා ඇති අතර නව පළාත් සභාව රැස් වී මෙන් පසු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කර සුදුසු වැඩපිළවෙළක් සකස් කරමි. |

**5.9.2 වෙනත් ආයතනවලට ලබාදුන් සම්පත්**

------------------------------

| | | |
|---|---|---|
| උඩදුම්බර පශු වෛද්‍ය කාර්යාලයට අයත් ගොඩනැගිල්ල හා රු.1,230,600 ක් වටිනා කිරි ශීත කිරීමේ උපකරණ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් උඩදුම්බර කිරි නිපදවන්නන්ගේ සහ සත්ත්ව නිෂ්පාදකයන්ගේ සුභසාධක සංගමයට 2015 වර්ෂයේ දී | ගිවිසුම් කඩකල පාර්ශවයන් පිළිබඳව ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මෙම මධ්‍යස්ථානය සම්බන්ධයෙන් කමිටුවක් පත්කර එම මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය හා මුදල් අයකිරීම පිළිබඳ කටයුතු කරමින් පවතින අතර එම මධ්‍යස්ථානය තක්සේරු කර බිම් කුලිය අයකර ගැනීමටත් කමිටුවේ ලබාදෙන තීරණ අනුව කටයුතු කරන බවත් දන්වමි. |

ආරක්ෂිත තැන්පතුවකින් තොරව ගිවිසුමකින් පවරා තිබුණු අතර එකී සංගමය විසින් එම ගොඩනැගිල්ල හා උපකරණ අනුමැතියකින් තොරව වෙනත් බාහිර පාර්ශවයකට ගිවිසුමක් මත පවරා දී තිබුණි.

**5.9.3 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) ප්‍රධාන අමාත්‍ය ආරක්ෂක රථය 2013 අප්‍රේල් 30 දින සිට පළාත් සභාව වෙත පවරා තිබුණ ද 2018 වර්ෂය දක්වා අවුරුදු 05 කට අධික කාලයක් තුළ කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අලුත්වැඩියා හා සේවා කටයුතු සඳහා පමණක් රු.2,100,682 ක් වැයකර තිබුණි. | අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායීනම් පමණක් කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (ආ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතු වාහන 25 ක් වර්ෂ 17 සිට 40 දක්වා පැරණි වාහන වූ අතර එම වාහන අළුත්වැඩියා හා සේවා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,768,631 ක වියදමක් දරා තිබුණි. ඉන් පාවිච්චි කළ නොහැකි හා අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන බැහැර කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ධාවනයට නුසුදුසු අලුත්වැඩියා කිරීම් ඵලදායී නොවන වාහන අපහරණය කිරීම පිළිබඳ නිකුත් කර ඇති චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වේ. | මින් එක් වාහනයක් වෙන්දේසි කර ඇති අතර දෙපාර්තමේන්තුව සතුව නව වාහන 24 ක් හා පැරණි වාහන 45 ක් ඇති අතර පැරණි වාහන සඳහා නව වාහන ලබාගැනීමට 2019 අගෝස්තු 17 දිනැති ලිපිය අනුව ඉල්ලීම් සිදුකර ඇති නමුත් මෙතෙක් නව වාහන ලැබී නොමැත. පැරණි වාහන ඉවත් කළහොත් පශු වෛද්‍ය නිලධාරින්ගේ ක්ෂේත්‍ර කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් නොමැති විය හැක. |

**5.10 කාර්ය මණ්ඩල පරිපාලනය**

2018 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**5.10.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන හා ප්‍රඥප්ති මගින් පිහිටවූ ආයතනවල සේවක සංඛ්‍යාව (පාසල් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩල හැර)**

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,008 | 755 | 281 | 32 |
| තෘතියික මට්ටම | 310 | 176 | 129 | 1 |
| ද්විතියික මට්ටම | 7,765 | 5,073 | 2,751 | 91 |
| ප්‍රාථමික මට්ටම | 7,287 | 5,569 | 1,610 | 517 |
| කොන්ත්‍රාත් | 16 | 108 | - | - |
| අනියම් ආදේශක | 2 | 583 | - | - |
| වෙනත් (ස්ථිර දීමනා) | 13 | - | 12 | - |
| ගුරු සහායක | - | 1,409 | - | 1,409 |
| වෙනත් (මගී ප්‍රවාහන සේවා අධිකාරිය | 329 | 271 | 54 | 1 |
| එකතුව | 16,730 | 13,944 | 4,837 | 2,051 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 22 ක් පැවතීම හේතුවෙන් සියලු රාජකාරී නිලධාරීන් කිහිපදෙනෙකු අතර බෙදී ගොස් තිබුණු අතර ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවකට භාජනය වන පරිදි නිලධාරීන් යෙදවීමට නොහැකි වී තිබුණි. | අභ්‍යන්තර පාලනය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අනුමත පුරප්පාඩු පිරවිය යුතු වේ. | ජ්‍යෙෂ්ඨ සංස්කෘතික නිලධාරීන් සඳහා පුරප්පාඩු පිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර සංවර්ධන හා කා.කා.ස. තනතුරු පුරප්පාඩු ප්‍රධාන අමාත්‍යාංශය හා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත දන්වා ඇත. |
| (ආ) මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ අනුමත සංවර්ධන නිලධාරි තනතුරු 76 න් 35 ක් පුරප්පාඩුව පැවති අතර සේවයේ යෙදී සිටින නිලධාරීන් 41 න් 21 ක් අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු දෙකක හා පළාත් මාර්ග | අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |

සංවර්ධන අධිකාරියේ සේවයේ යොදවා තිබුණි. ඔවුන්ට අදාළ වැටුප් අමාත්‍යාංශය මඟින් ගෙවමින් පැවතුණි. මේ අනුව අමාත්‍යාංශයේ කටයුතු සඳහා සංවර්ධන නිලධාරී තනතුරු 76 කගේ අවශ්‍යතාවයක් නොතිබුණි.

### 5.10.2 පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු | 1,458 | 1,015 | 445 | 2 |
| නියෝජ්‍ය විදුහල්පති /සහකාර විදුහල්පති | 575 | 603 | 97 | 125 |
| ගුරුභවතුන් | 27,714 | 28,397 | 460 | 1,143 |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 2,222 | 1,529 | 1,021 | 328 |
| එකතුව | 31,969 | 31,544 | 2,023 | 1,598 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) විදුහල්පති පුරප්පාඩු කොත්මලේ කලාපයේ 22 ක්, හැටන් 20 ක්, නාඋල 16 ක්, මාතලේ 34 ක් හා විල්ගමුවේ 25 ක් පැවතියද එම තනතුරු ආවරණය කරමින් පැවතුණි. ගුරු පුරප්පාඩු නුවරඑළිය 186 ක් හා කොත්මලේ 205 ක් පැවති අතර වැඩ බලන විදුහල්පති තනතුරු 75 ක් ගුරු උපදේශක තනතුරු ලෙස නාඋල 12 ක්, මාතලේ 11 ක් හා විල්ගමුවේ 06 ක් පැවතුණි. තවද වෙනත් ස්ථානවලට අනුයුක්තව 05 ක් හා නාඋල තාවකාලික අනුයුක්ත 39 ක් ලෙස ගුරු පුරප්පාඩු 149 ක් ආවරණය වී නොතිබුණි. | • විදුහල්පති තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.<br>• ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.<br>• වැඩබලන විදුහල්පතිවරුන් සඳහා විධිමත් පත්වීම් ලබාදීම හා විදුහල්පති පුරප්පාඩු සම්පූර්ණ කිරීම. | • අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.<br>• ඉදිරියේ දී සුදුසුකම් පරීක්ෂාකර බලා පත්වීම් ලිපි නිකුත් කරනු ලබන අතර පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් පළාත් අධ්‍යාපන ලේකම් වෙත යවා ඇත. |

| | | |
|---|---|---|
| (ආ) 2016 – 2018 අතර කාලය තුළ නුවරඑළිය අධ්‍යාපන කලාපයෙන් වෙනත් කලාපවලට ස්ථානමාරුවී ගිය ගුරුවරුන් 33 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු අදාළ කලාපවලට යැවීමේදී මාස 04 සිට වසර 03 දක්වාද හැටන් අධ්‍යාපන කලාපයෙන් වෙනත් කලාපවලට ස්ථාන මාරුවී ගිය ගුරුවරුන් 15 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු යැවීමේදී මාස 04 සිට වසර 01 දක්වා වූ කාල ප්‍රමාදයක් ද සිදුව තිබුණි. | ප්‍රමාදයකින් තොරව පෞද්ගලික ලිපිගොනු අදාළ ආයතන වෙත යැවීම. | අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) නුවරඑළිය අධ්‍යාපන කලාපයට අයත් පාසැල් 13 ක ගුරුවරුන් 17 දෙනෙකුගේ වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම වසර 03 සිට වසර 13 දක්වා කාල පරාසයක් ප්‍රමාදවී තිබූ අතර මෙම ප්‍රමාදය හේතුවෙන් එම ගුරුවරුන්ගේ වැටුපට 2016 පෙබරවාරි 25 දිනැති 3/2016 චක්‍රලේඛය ප්‍රකාරව ගැළපීම්ද කර නොතිබුණි. 2018 දෙසැම්බර් වන විට හැටන් අධ්‍යාපන කලාපයට අයත් පාසැල්වල ගුරුවරුන් 310 දෙනෙකුගේ වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම මාස 01 සිට වසර 10 දක්වා කාල ප්‍රමාදයක් සිදුව තිබුණි. | ගුරුවරුන් දැනුවත් කර අවශ්‍ය වාර්තා ලබාගෙන නියමිත පරිදි වැටුප් වර්ධක ලබා දීමට කටයුතු කිරීම. | අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**5.10.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය**

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,222 | 965 | 263 | 7 |
| තෘතියික මට්ටම | 390 | 334 | 56 | - |
| ද්විතියික මට්ටම | 3,926 | 3,286 | 655 | 15 |
| ප්‍රාථමික මට්ටම | 3,594 | 2,232 | 1,125 | 15 |
| කොන්ත්‍රාත් | - | 1 | - | - |
| අනියම් | - | 252 | - | - |
| එකතුව | 9,132 | 7,070 | 2,099 | 37 |

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවක මට්ටම් 04 ක පුරප්පාඩු 2099 ක් පැවතුණි.

**5.11 ප්‍රසම්පාදනය**

**සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) නියමිත පිරිවිතරයන් සඳහන් නොකර හා ලියාපදිංචි සැපයුම්කරුවන් නොවන ආයතනවලින් කැඳවන ලද මිල ගණන්වලට සහ අවම මිලට මිලදී ගැනීමට දක්වා තිබූ ටෙන්ඩර් තීරණයන්ට පටහැනිව මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 06 ක දී පළාත් සංවර්ධන යෝජනා යටතේ රු.1,094,424 ක භාණ්ඩ මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් මිලදී ගැනීමේ කටයුතු කළ යුතු වේ. | පිළිතුරු සපයා නැත. |
| (ආ) අග්‍රාස් බෝපත් තලාව මාර්ගය ඉදිකිරීමේ දී වැඩ විෂයන් 05 ක් සඳහා ඇස්තමේන්තු වටිනාකමට වඩා රු.2,729,316 ක් වැඩියෙන් වූ වටිනාකමට ටෙන්ඩරය පිරිනමා තිබුණි. | වැඩි වූ මිල සම්බන්ධයෙන් තාක්ෂණික කමිටු නිලධාරින්ගෙන් හේතු විමසිය යුතු වේ. | අතාත්වික වැඩි අනු ප්‍රමාණයක් බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව සැලකිල්ලක් දක්වා නොමැත. |
| (ඇ) රිකිල්ලගස්කඩ විධායක ඉංජිනේරු කාර්යාලය මඟින් අවස්ථා 03 ක දී රු.1,343,766 ක් වටිනා මිලදී ගැනීම් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.14.1 යටතේ වූ විධිවිධාන අනුගමනය කර නොතිබුණි. | දෝෂ සහගත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්යෙන් කටයතු කළ යුතු වේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු ලැබූ තීරණ මත මිලදී ගැනීම් සිදුකර ඇත. |
| (ඈ) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව පශු වෛද්‍ය කාර්යාල 09 ක් පවත්වා ගෙන යාම සඳහා | ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය අනුගමනය කළ යුතු වේ. | ගොඩනැගිලි කුලියට ගැනීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වුවත්, ගොඩනැගිලි සොයා ගැනීමේ අපහසුතාවය නිසා එම කටයුතු කිරීමට නොහැකි වී ඇත. |

ගොඩනැගිල්ල වෙනුවෙන් රු.1,168,000 ක ගොඩනැගිලි කුලී ගෙවා තිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 නොවිසඳී ඇති විගණන ඡේද**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) උඩවෙල බණ්ඩාරනායක විද්‍යාලයේ අවස්ථා 11 කට අදාළ රු.8,584,356 ක හානි පාඩු පිළිබඳව 2017 හා 2018 වර්ෂයේ දී විගණන විමසුම් මඟින් පෙන්වාදී තිබුණ ද 2019 මාර්තු මස වන විටත් මු.රෙ.104(4) පරීක්ෂණ සිදුකර වගකිව යුත්තන් නිශ්චය කර පාඩු පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | පරීක්ෂණ මණ්ඩල පත් කර තොරතුරු පරීක්ෂාකර ඇත. |
| (ආ) අයකර ගතයුතු මුදල් අයවී ඇති බව සනාථ වන පරිදි ලිපිගොනු අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නඩත්තු නොකිරීම හා අයවීම් සනාථ වන සාක්ෂි ගෙන්වා නොගැනීම හේතුවෙන් මු.රෙ.104(4) පරීක්ෂණ මඟින් අවස්ථා 21 කදී නිර්දේශිත එකතුව රු.1,560,102 ක් වූ අධිභාර අයවී ඇති බව විගණනයට තහවුරු කරගත නොහැකි විය. | අධිභාර අයවීම් සනාථ වන සාක්ෂි ලිපිගොනු තුළ තිබිය යුතු වේ. | පිළිතුරු ලැබී නැත. |
| (ඇ) මහනුවර ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ 2001 වර්ෂයේ ගබඩා සමීක්ෂණයේදී අනාවරණය වූ රු.1,217,482 ක ගබඩා ද්‍රව්‍ය ඌනතාවය සම්බන්ධයෙන් මු.රෙ.104(4) යටතේ පරීක්ෂණයක් පවත්වා ගබඩා භාරකරු 2002 අප්‍රේල් 18 දින සිට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 වගන්තිය | ගබඩා භාණ්ඩ ඌනතාවයේ වටිනාකම අයකර ගත යුතුවේ. | ඡේදය පිළිගනිමි. |

| | | |
|---|---|---|
| යටතේ විශ්‍රාම ගන්වා වසර 15 ක් පමණ ගතවී ඇති නමුත් අදාළ ගබඩා ඌනතාවය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |

**6.2 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට යෝජිත එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක අරමුණු කරගත් ප්‍රතිඵල පාදක මධ්‍යකාලීන ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීම 2018 සැප්තැම්බර් 30 දින වන විට නිමකළ යුතුව තිබුණ ද 2019 මැයි මාසය වන විටද නිමකර නොතිබුණි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |